# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,949 — 1918ක්වූ ජූනි මස 14වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාධ්‍යා නීති.

1906යේ නගර පාඨශාලා ආඥාපණත.

ඉහළ සඳහන්කළ ආඥාපණතේ 7 (1)වෙනි වගන්තිය යටතේ වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 9වෙනි දින මාතර ලෝකල් බෝඩ් සභාව විසින් සාදනලද වර්‍ෂ 1918 ජනවාරි මස 25වෙනි දින නොම්මර 6,921 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරනලද උපනීතිවලට ඇතුළත්කරනලද "බී" අක්‍ෂරයේ ෂැඩ්‍යුල් පත්‍රයට මෙහි පහත පෙනෙන පාඨශාලාවල්ද එම ලෝකල් බෝඩ් සභාව විසින් වැඩිපුර ඇතුළත්කරනලදින් එය වැඩබලන ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ සම්මතය ඇතිව ස්ථිරකරනලදින් පොදුජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධකරනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 11වෙනි දින කොළඹ.
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වරයා.

පාඨශාලාවල නම්.

මාතර ආණ්ඩුවේ මහමත් ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව.
උයන්වත්තේ ධර්මරජ පාඨශාලාව.

---

### 1918වේ අවුරුද්දේ කතරගම වන්දනාකාලය සම්බන්ධ ව්‍යවස්ථා.

1. සනීප ආරක්‍ෂාව සඳහා කතරගම වන්දනා කාලය සහ වන්දනාකාරයින්ට කතරගම නවතින්ට පුළුවන් කාලය 16 දවසක් බව එනම්, 1918වේ ජූලි මස 8වෙනි දින පටන් ජූලි මස 23වෙනි දින පමණක් බව මෙයින් නියමකලා ඇත. ඉහත මුලින් සඳහන් දිනේට ප්‍රථම පැමිණෙන්නාවූ හෝ ඒ නියමකල කාලයට පසු එහි නැවතී සිටින්නාවූ යම් වන්දනාකාරයෙක් ඇත්නම් ඔහු අපරාධකාරයෙක් මෙන් ඒත්තුගනු ලැබේ.

2. ලෙඩ නිසා හෝ, දුර්වලකම නිසා හෝ, ශක්ති මදිකම නිසා හෝ, වයස වැඩිකම නිසා හෝ, බාල වයස්කම නිසා හෝ, කෑමට ගන්නා ද්‍රව්‍ය හිඟකම නිසා හෝ, වෙනත් සෑහෙන කරුණක් නිසා හෝ ගමන යන්ට නුසුදුසුවන් වන්දනාකාරයෙක්ය කියා හෝ ලෙඩවී එයින් වෙනඅයගේ සනීපයට අහිතකරවේය කියා පේන වන්දනාකාරයන්ද, පොලිස් භාරකාරතැනට හෝ පොලිස් බලේ ඇති කෙනෙකුට ගමනේ කොයි ස්ථානයකදී වුවත් එවැනි වන්දනාකාරයින්ට (කතරගමට) යන්ට නොදී නවත්වන්ට බලය තිබේ. තවත් එකී වන්දනාකාරයින්ට නියම කරන ආඥාවලට ඔවුන් කීකරුකරවීම සඳහා ඇපගැනීමටත් බලය තිබේ. එසේ ඇප දෙන්ට නුසුදුසුවන් වන්දනාකාරයෝ දවස් තුනකට වැඩිනොවන කාලයක් හිරගෙයි තබාගෙන නවත්වා ගැනීමට පොලිස් භාරකාරතැනට හෝ පොලිස් බලය ඇති අයට බලය තිබේ.

3. කතරගම වන්දනාකාලය (පෙරහැර) පවත්නා කාලය තුළදී යම් වසංගත රෝගයක් පැමිණුනොත් ඒ කාලය තුළ ව්‍යවස්ථා ක්‍රියාකරවීම සඳහා පත්කර සිටින මුලාදෑනීන්ට එකී වන්දනාකාලය හෙවත් පෙරහැර නවත්වන්ට බලය තිබෙනවාත් ඈර වන්දනාකාරයන් සියල්ලම නොපමාව එකී ගමෙන් පිටවී තමතමන්ගේ ගෙදරවලට යන්ට නියමකරන්ටත්, අසවල් පාරේ ගමන්කරන්ටය කියා නියමකරන්ටත් බලය තිබේ.

4. ව්‍යවස්ථා ක්‍රියාකරවීම සඳහා පත්කර සිටින මුලාදෑනීන්ට කතරගමදී සහ කතරගමට යන ගමනේදීද, එහි සිට පිටත්වී යන ගමනේදීද මෙහි පහත පේන කාරනා නියමකරන්ට සහ කරවන්ටත් බලය තිබේ.

(ඒ) වන්දනාකාරයින්ට රෙදි සේදීමටද, නෑමටද, වතුර ගැනීමටද, වතුර බීමටද, ශරීර කෘත්‍ය කිරීමටද වෙන වෙන ස්ථාන නියමකෙරීමටද;

(බී) ඒ ඒ මඩිවල වන්දනාකාරයින්ට නැවතීමට වෙන වෙන ස්ථාන නියමකෙරීමටද;

(සී) වන්දනාකාරයන් කාන්ඩයක ගමන අසවල් මාර්ගයෙන් විය යුතුයයි නියමකිරීමටද;

(ඩී) වන්දනාකාරයින්ට දෙන්නාවූ කෑම බෙදාදීම ගැන බලා නියමකිරීමටද;

(ඊ) ලෙඩවෙන්නාවූ වන්දනාකාරයන් නැවැත්වීමට වෙනම ස්ථාන වෙන්කර තැබීමට සහ ඔවුන් සමග වෙන අයට කථාකෙරීමට ඉඩනොදෙන ලෙසටද, ඔවුන්ට ගමන්යන්ට නුසුදුසුවන්නම් නවත්වා ගැනීමටද.

මෙසේ පත්වීසිටින මුලාදෑනියෙක් නියමකරන ආඥාවක් කඩකරන අයෙක් වරදක්කළ අයෙක් මෙන් ඒත්තුගනුලැබේ.

5. ගමනේදී හෝ නැවතී සිටින ස්ථානයකදී වෛද්‍යාචාරිකෙනෙක් හෝ, එසේ කෙනෙක් නැතිවිටක ප්‍රධාන පොලිස් මුලාදෑනියා විසින් අපථ්‍ය කෑමය කියා කියන සෑම කෑම ද්‍රව්‍යවල්ම නසනමට ගෙන නාස්තිකරනලෙස පොලිස් බලය ඇති අය බැඳි සිටිනවාත් ඈර එසේ කිරීමට ඔවුන්ට බලය තිබේ. පොලිස් බලය ඇති අයවල් මෙම යුතුකම් හෝ මෙම ව්‍යවස්ථාවලින් නියමකර තිබෙන යුතුකම් ක්‍රියාකරනවිට විරුද්ධව සිටින නොහොත් බාධාකරන යමෙක් ඇද්ද ඔහු වරදක් කළා මෙන් ඒත්තුගනුලැබේ.

6. ගවයන් නොහොත් කරත්ත ගොන් කඳවුරට ගෙනෙන කෙනෙක් විනිසුන් සහ බඩු බාහු වහාම එම කරත්ත ගොන් දෙටගමුවේ වෙල්වල නවත්වන්ට ඕනෑය.

7. නැවතීසිටින ස්ථානයේදී (එනම කතරගමදී) වන්දනාව භාරව පැමිණි ප්‍රධාන මුලාදෑනියා විසින් නියමකරන ස්ථානය ඈර වෙන ස්ථානයකදී යම් මාංසයක් විකුණන අයෙක් හෝ වෛද්‍යාචාරි කෙනෙක් හෝ එසේ නැතිවිට ප්‍රධාන පොලිස් මුලාදෑනියෙක් හෝ අපථ්‍ය කෑමය කියා තීන්දුකරන්ට යෙදුන යම් කෑමට ගන්නා ද්‍රව්‍යයක් විකුණන අයෙක් ඇද්ද ඔහු වරදක් කළාමෙන් ඒත්තුගනුලැබේ.

8. යම් අයෙක් කතරගම නැවතිසිටින කාලය තුළදී ආණ්ඩුව විසින් සාදා තිබෙන ස්ථානයක හැර වෙන ස්ථානයක ශරීරකෘත්‍ය කරන්ට යෙදුනොත් හෝ, එසේ කර එකී අසූචි පස්වලින් හෝ වැලිවලින් වසාදමන්ට නොයෙදුනොත් හෝ මුලාදෑනියා විසින් නියමකර තිබෙන ස්ථානයට ඉහළින් ගඟට බසින්ට හෝ ගඟේ නාන්ට යෙදුනොත් එකී අය වරදක් කළාක්මෙන් ඒත්තුගනුලැබේ.

9. බෝවෙන හෝ මාරුවෙන රෝගයකින් පෙළෙන යමෙක් ඒ බව වෛද්‍යාචාරීතැනට හෝ එසේ කෙනෙක් නැතිවිට ප්‍රධාන පොලිස් මුලාදෑනියාට දන්වන්ට නොයෙදුනොත් එවැනි අයද, එසේ රෝගයක් වැළඳී සිටි අයෙක් සඟවන්ට හෝ සැඟවීමට අත්උදව්දෙන්ට යෙදෙන යම් අයවල් ඇත්නම් ඒ අයවල්ද වරදක් කළාක්මෙන් ඒත්තුගනු ලැබේ.

10. සෑම ගුයවලුක්ම ගමනේදී සහ කතරගමදී පොලිසියේ ප්‍රධාන මුලාදෘනියා නියමකරන ස්ථානවල නවාතැන්ගන්ට ඕනෑවත් ඇර එසේ කරන්ට බැරිය කියන්නාවූ හෝ නොකරන්නාවූ යම් අයෙක් ඇද්ද ඔහු වරදක් කළාක්මෙන් ඒන්තුගනු ලැබේ.

11. වර්ෂ 1918වේ වන්දනාවට යෑමට තමා පදිංචි දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් හෝ උප ඒජන්තතුමාගෙන් ප්‍රථමකොට අවසරපත්‍ර ලබාගත විස පිටත්විය නොහැකිය. ඉන්දියාවෙන් එන වන්දනාකාරයන් විසින් වෛද්‍ය සම්බන්ධ කොමිටියේ ප්‍රධානතුමාගෙන් අවසරපත්‍ර ලබාගත යුතුයි.

12. පොලිස් බලේ ඇති කොයිම මුලාදෘනියෙක් හෝ ඉහතකී ආඥාපණත යටතේ පනවාතිබෙන ව්‍යවස්ථා ඉෂ්ටකරවීමට පත්වී සිටින අයෙක් විසින් හෝ ඉල්ලුවිටකදී වන්දනාකාරයන් විසින් අවසරපත්‍ර පෙන්විය යුතුයි.

13. අවසර පත්‍රයක නම් තිබෙන අය විසින් එම පත්‍රය වෙන කෙනෙකුට දීම සහ වෙන කෙනෙක් විසින් එම අවසර පත්‍රය පාවිච්චි කිරීමත් මෙයින් තහනම්ය

## කතරගම වන්දනාව.

වර්ෂ 1896යේ නොම්මර 13 දරණ ආඥාපණත යටතේ පනවනලද නියෝග අතුරෙන් 11වෙනි නියෝගය ප්‍රකාර පොදු ජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රසිඩලෙස දැනුම්දෙනු ලබන්නේනම් කතරගම පිහිටා තිබෙන රුහුණු මහකතරගම දේවාලයට වන්දනාමානාදිය පිණිස ඇසැලමහ මංගල්‍යයට හෝ ඉල්මහ කාච්චි මංගල්‍යයට පැමිණෙන සියලුදෙනාම තම තමුන් පදිංචි සිටින පලාත්වල ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් හෝ උපඒජන්ත උන්නාන්සේගෙන් ප්‍රවේශපත්‍ර කලින් ලබාගෙන පැමිණිය යුතුබවය. එසේ ප්‍රවේශපත්‍ර නොලබා පැමිණෙන සියලුදෙනාටම මතුකී ආඥාපණතේ දෙවෙනි වගන්තිය යටතේ රුපියල් 1,000කට වැඩිනොවන දඩයකට හෝ බරපතල වැඩ ඇතුව හෝ නැතුව අවුරුද්දකට වැඩිනොවන කාලයක් හිරඅඩස්සියට යවන්වෙන්ට වෙනබව වැඩිදුරටත් දැනගත යුතුයි.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

වර්ෂ 1918ක්වූ ජූනි මස 8වෙනි දින කොළඹ
කොලෝනියල් සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන කොලෝනියල් සෙක්‍රතාරිස් වහන්සේ.

---

## ඉඩම් විකිණීම.

**No. 3,147, S. P.**—දකුණු දිසාවේ මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජූලි මස 24වෙනි දිනවූ බදාදා පස්වරු 3·30ට මොරවක තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර පලාතේ මොරවක්කෝරලේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 20ක්.

සිතියම 17. ගම—පනාකඩුව. ඉල්ලුම්කාරයා—ආණ්ඩුව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. අන්දම—හේන.

| නො. | ඉඩමේ නම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1b | කෝන්ගහවිටේවත්ත .. | 0 | 1 | 26 | 20 |
| | සිතියම 25. ගම—ඊදඹුකිත. | | | | |
| 2b | මහඅරඹේහේන නොහොත් කන මිටියාගලහේන .. | 0 | 1 | 33 | 120* |
| 2c | එම .. | 0 | 1 | 30 | 120* |
| 2d | එම .. | 0 | 2 | 15 | 120* |
| 2e | එම .. | 0 | 2 | 11 | 120* |
| 2f | එම .. | 0 | 2 | 1 | 120* |
| 2g | එම .. | 0 | 2 | 9 | 120* |
| | සිතියම 49. ගම—කළුබෝවිටියාන. | | | | |
| 26aa | කිතුල්විටියලේහේන .. | 0 | 1 | 9 | 100* |
| 26aa2 | එම .. | 0 | 1 | 3 | 100* |
| 26aa3 | කිතුල්විටියලේහේන .. | 0 | 0 | 14 | 100* |
| 26av | එම .. | 0 | 3 | 25 | 100* |
| 26aw | එම .. | 1 | 1 | 18 | 100* |
| 26af | එම .. | 0 | 0 | 20 | 100* |
| 26ay | එම .. | 0 | 3 | 16 | 100* |
| 26az | එම .. | 1 | 0 | 6 | 100* |
| 26bb | එම .. | 1 | 0 | 24 | 100* |
| 26bc | එම .. | 0 | 3 | 19 | 100* |
| 26bd | එම .. | 1 | 0 | 20 | 100* |
| 26be | එම .. | 1 | 0 | 9 | 100* |

සිතියම 170. ගම—පල්ලේගම. ඉල්ළුම්කාරයා—ආර්. ඇල්. ඒ. ගුණවර්ධන. අන්දම—බැද්ද.

| නො. | ඉඩමේ නම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 161bx | හල්දෙලේහේන .. | 2 | 3 | 0 | 150* |

* මෙම ඉඩම් මිනිරන් බද්දත් සමග විකුණනු ලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ මාතර උපඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වහන්සේ.

වර්ෂ 1918ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

---

**No. 3,148, S. P.**—දකුණු දිසාවේ මහාඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 8වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ හිනිදුම්පත්තුවේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 5ක්.

සිතියම 488. ගම—පනන්ගල. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 121e | පෝරුබස්නාවේගොඩහේන නොහොත් පෝරුපන්නාවේගොඩ .. | පනන්ගල පදිංචි වික්‍රමතුන්ග එරනෝලිස් | හේන .. | 1 | 0 | 38 | 15 |
| | | සිතියම 484. ගම—හිනිදුම. | | | | | |
| 486a | නාඝන්ගසඇලලයගොඩැල්ල .. | හිනිදුම පදිංචි ඕ. ඒ. සෙනෙවිරත්න .. | එම .. | 0 | 2 | 25 | 16 |
| 485e | වතුරවේකැලේ .. | ජී. ජිනිස් ද සිල්වා .. | .. බැදූ සහ පතන | 0 | 3 | 31 | 60 |
| 485f | එම .. | ජී. යකෝනිස් .. | .. බැද්ද .. | 0 | 2 | 21 | 60 |
| 485k | විතානේගෙදරගොඩළුඩහකන්ද .. | එච්. ඕ. දිනෝරිස් .. | .. හේන .. | 1 | 1 | 22 | 19 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ දකුනු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වහන්සේ.

---

**No 3,149, S. P.**—දකුණු දිසාවේ මහාඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 6වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තර වලල්ලාවිටිකෝරලේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 10,878. ගම—යටගල. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | අඹගහළුඹුල්ලේමානාන .. | ජී. ඒ. ද සොයිසා .. | පතන .. | 0 | 3 | 29 | 50* |

* මිනිරන් හෑරීමේ බලය ඇතුව රු. 250යි.

| අංකය | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | අඹගහඋඩුමුල්ලේමානාන | — | පතන (විකුණන්නේ නැහැ) | 0 0 12 | —† |
| 3 | එම | — | එම | 0 0 12 | —† |

† තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරනා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වම් 1918ක්වූ ජූනි 12වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

**No. 2,040, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1918ක්වූ අගෝස්තු මස 1වෙනි දිනවූ බෘහස්පතින්ද පස්වරු 10 අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම්, හුරුලු සහ කලාගම් පලාත්වල පිහිටාතිබෙන බිම් කෑබලි 32ක්.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 5,211. ගම—උඩියන්කුලම්කෝරළේ කසිනාවිටම. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | මයිලගහඉඩම | කසිනාවිටමේ ඩබ්ලිව්. ජී. විකිරිඅප්පු | වියට සුදුසු අත්දඹුවා කැලේ | 3 3 20 | 16·50 |
| 2 | එම | — | ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 2 35 | —* |
| 3 | හැලඹගහඉඩම | කසිනාවිටමේ ඇස්. වී. උක්කුරාල වෙදරාල | වියට සුදුසු අත්දඹුවාකැලේ | 1 0 33 | 15 |
| 4 | එම | — | ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 0 30 | —* |
| 5 | එම | — | අත්දඹුවාකැලේ | 1 0 15 | 18 |
| 6 | එම | — | ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 1 10 | —* |
| 7 | එම | කසිනාවිටමේ ඇස්. වී. උක්කුරාල සහ තවත් දෙන්නෙනක් | වියට සුදුසු අත්දඹුවාකැලේ | 1 0 25 | 22·50 |
| 8 | එම | — | අත්දඹුවාකැලේ | 2 0 31 | 17·50 |
| 9 | පනක්කාගහඉඩම | සිරාල වෙල්විදානේ | වියට සුදුසු ලොකු මූකලාන | 2 3 22 | 20 |
| | සිතියම 5,218. ගම—කිරපවකෝරළේ හම්මිල්ලෑව. | | | | |
| 1 | ගලපාළලවෙල | ආණ්ඩුව | පී. අප්පුහාමි විසින් අල්ලාගත් කුඹුර | 0 1 1 | 25 |
| 2 | එම | එම | එම | 0 1 15 | 25 |
| | සිතියම 5,220. ගම—උලගල්ලකෝරළේ උංවිරිමඩුව. | | | | |
| 1 | මීගහඉඩම | යූ. කේ. චන්ද්‍රසේකර | මූකලාන | 6 3 28 | 20 |
| 2 | මීගහකැලේ | — | ඇරතිබෙන බිම සහ අඩිපාර | 0 0 9 | —* |
| 4 | එම | යූ. කේ. චන්ද්‍රසේකර | මූකලාන | 0 1 23 | 15 |
| 5 | කොටුකුඹුර | එම | අප්පුහාමි හිටපු වෙල්විදානේ විසින් අල්ලාගත් කුඹුර | 0 0 26 | 30 |
| | සිතියම 5,221. ගම—කිරලවකෝරළේ හිඟුරුවැව. | | | | |
| 1 | කෝන්ගහඉඩම | දිගනේගම පුංචිරාල වෙදරාල සහ තවත් එක්කෙනෙක් | වියට සුදුසු කැලේ | 1 0 2 | 15 |
| 2 | ගොඩකිරලගහඉඩම | දිගනේගම ඇන්. අප්පුහාමි සහ තවත් එක්කෙනෙක් | එම | 1 0 12 | 15 |
| 3 | එම | එම | බන්ඩිරාල හිටපු වෙල්විදානේ විසින් අල්ලාගත්කුඹුර | 0 0 15 | 25 |
| 4 | එම | එම | වැකන්දට ඉතුරුකර තිබෙන බිම | 0 1 1 | —* |
| | සිතියම 5,222. | | | | |
| 1 | හැලඹගහඉඩම | දිගනේගම පුංචිරාල වෙදරාල | වියට සුදුසු කැලේ | 2 0 17 | 15 |
| 2 | එම | — | පාරට ඇර තිබෙන බිම | 0 0 20 | —* |
| | සිතියම 5,223. ගම—කිරලවකෝරළේ තෙල්දින්නක්වැව. | | | | |
| 1 | වෙලේගොඩහේන | තෙලදින්නක්වැවේ වේලාගමයා | වියට සුදුසුකැලේ | 0 3 35 | 15 |
| | සිතියම 5,224. ගම— උලගල්ලකෝරළේ ඔරුක්මාන්කුලම. | | | | |
| 1 | කහටගහවෙලමූකලාන | ඩබ්ලිව්. මල්හාමි | මූකලාන | 1 0 26 | 15 |
| 2 | ගල්පොත්තේපටිය | එම | ලඳුකැලේ | 0 1 18 | 15 |
| 3 | කෝන්ගහඉඩම | කේ. උක්කුබන්ඩා | මූකලාන | 1 0 0 | 15 |
| 4 | ගෙදරගාවමූකලාන | — | ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 1 0 | —* |
| | සිතියම 479. ගම—නුවරගම්කෝරළේ බෙල්ලන්කඩවල. | | | | |
| 4*d* | බෙල්ලන්කඩවල කැලේ | මරක්කල පලුගොල්ලෑවේ පී. ඔමරුකම්බි | ලඳුකැලේ | 2 0 8 | 17 |
| 4*f* | අක්කරඉඩම | එම | ඒ. ඒ. ජෝනා. කරයිහමුරික්කාර් සහ තවත් එක්කෙනෙක් විසින් අල්ලාගත් කුඹුර | 0 1 5 | 20 |
| 4*g* | එම | — | එම | 3 2 2 | 20 |
| 4*h* | එම | — | එම | 0 0 12 | 20 |
| 4*i* | එම | — | එම | 0 0 30 | 20 |
| 4*k* | බෙල්ලන්කඩවල කැලේ | — | ලඳුකැලේ | 0 1 2 | 17 |

* විකුණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වම් 1918ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

**No. 1,268, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 1වෙනි දිනවූ බෘහස්පතින්දා දවල් 12ට බදුලු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුලු දිස්ත්‍රික්කේ යටිකිද කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

සිතියම 1,997. ගම—යටිකිද පස්සරකෝරලේ පාලාගොල්ලේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ගල්බොක්කවතුගොඩපතන .. | ජේ. ජේ. රොබින්සන්මහතා | .. පතන තැනින්තැන කැලෑගස් තිබේ | 26 | 0 | 36 |
| 2 | බලානිවත්ත .. | එම | .. තේ තවානක් තිබේ .. | 0 | 0 | 31 |
| 3 | එම .. | එම | .. එම .. .. | 0 | 3 | 28 |

බදු කොන්දේසි.

(*a*) තක්සේරු මුදලවන රුපියල් 140ක "පිරිමියම්" මෙන් ලාභ මුදලපිට අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකටවුවත් රුපියල් 2ක ගණනේ ඉහත සඳහන්වෙන ඉඩම් අවුරුදු 50කට බදු දෙනු ලැබේ.

(*b*) මෙම ඉඩමේ බද්ද දෙනු ලබන්නේ යම් කාලයෙක ආණ්ඩුවට මේ ඉඩම බදුලු පස්සර රේල් පාර කැපීමට උවමනාවී නම් නොමිලේ ගන්න කොන්දේසිය පිටයයි.

(*c*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*d*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පලකරණු ලැබේ.

(*e*) තේ වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනු ලැබේ.

(*f*) ඉඩම තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*g*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දු වියයුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*h*) අවුරුදු 25කට වරක් බද්ද අළුත්වැඩියාකෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 25ට ගෙවිවාවූ බදු මුදලින් බාගයකට වැඩිනොවේ.

(*i*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 7වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍මහ.

---

**No. 1,269, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 1වෙනි දිනවූ බෘහස්පතින්දා දවල් 12ට බදුලු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුලු දිස්ත්‍රික්කේ උඩුකිද කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

මුල් සිතියම 1,973. ගම—උඩුකිද මහපලාතකෝරලේ හපුතලේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | තඹිරිනපතන නොහොත් කබරගලපතන .. | ඩබ්ලිව්. ඇම්. හෝල් මහතා | .. පතන | 0 | 2 | 37 |
| 4 | එම .. | එම .. | .. පතන සහ ගල | 23 | 0 | 22 |
| 5 | එම .. | එම .. | .. එම | 10 | 2 | 20 |
| 9 | තඹිරිනපතන .. | එම .. | .. එම | 4 | 0 | 22 |

බදු කොන්දේසි.

(*a*) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකේට බදුදෙනු ලැබේ.

(*b*) මෙම ඉඩම් එකින් එකට "පිරිමියම්" වන තක්සේරු මුදල් මෙසේය රුපියල් 8, රුපියල් 144, රුපියල් 66, රුපියල් 35, වේ.

(*c*) අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකටවුවත් බදු මුදල රුපියල් 3ක් වේ.

(*d*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක්වේ.

(*e*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*f*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පල කරණු ලැබේ.

(*g*) තේ සහ ගස් වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනු ලැබේ.

(*h*) ඉඩම තේ සහ ගස් වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*i*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*j*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිවාවූ බදු මුදලින් භාගයකට වැඩිනොවේ.

(*k*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් සම්බන්ධ කාරණා ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 7වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍මහ.

---

**No. 1,270, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 2වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුලු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුලු දිස්ත්‍රික්කේ යටිකිද කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

අන්තිම සිතියම 27. ගම—යටිකිද කුඹල්වෙලකෝරලේ උඩුකුඹල්වෙලගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 13*az* | අතුනුඅගිගලපතන .. | බන්ඩාරවෙල ඩී. ඩී. අබේසේකර මහතා | .. පතන | 11 | 2 | 32 |
| 13*bb* | කොකට්යපදුරේපතන .. | එම .. .. | .. එම | 20 | 2 | 34 |
| 13*bh* | දික්ආරාවේපතන .. | එම .. .. | .. එම | 2 | 2 | 13 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අත්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 13bn | ගුරුකපුරේපතන .. | කිනිගහ මොනරපිටියේ වත්තේගෙදර උක්කුබන්ඩා සහ බන්ඩාරවෙල උඩුඋල්පොතේ උඩවත්තගේ අන්දිරිස් අප්පුහාමි .. .. | .. පතන සහ ඇල .. | 4 3 21 |

බදු කොන්දේසි.

(a) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකෙට බදුදෙනු ලැබේ.

(b) මෙම ඉඩම් එකින්එකට "පිරිමියම්" වන තක්සේරු මුදල් මෙසේය රුපියල් 60, රුපියල් 105, රුපියල් 18, රුපියල් 30ක් වේ.

(c) අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකටවුවත් බදුමුදල රුපියල් 2ක්වේ.

(d) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක්වේ.

(e) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(f) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජයන්තකය කියා පලකරණු ලැබේ.

(g) තේ වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(h) ඉඩම තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(i) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(j) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවුවාවූ බදු මුදලින් බාගයකට වැඩිනොවේ.

(k) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම සම්බන්ධ වැඩිදුර කාරනා ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජූනි මස 7වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කළුතර දැන්වීම නො. 6,902.]

වර්ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903න් ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත් වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
ඉඩමේ තොරතුරු. විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කේ බස්නාහිර පස්දුන්කෝරළේ වලල්ලාවිටිපත්තුවේ ගුලවිට යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 89 මුල් සිතියමේ 1Tත් පෙනෙන අක්කර 1කුත් පර්චස් 26ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් හල්වලකැලේ කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්:—උතුරට නෙළුන් කැටියේදෙළද; නැගෙණහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු හල්වලමූකලානද; දකුණට ගම්මගේ දෙන් හෙන්ද්‍රික් සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹගහවත්තද, එම අය විසින් අයිතිකම්කියන නෙළුන් කැටියේකුඹුරද; බස්නාහිරට ගම්මගේ දෙන් හෙන්ද්‍රික් සහ තවත් අය විසින් අයිතිකම්කියන නෙළුන්කැටියේකුඹුරද, නෙළුන් කැටියේදෙළද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1057වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කළුතර වි. ම. 8—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 6,903.]

වර්ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903න් ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන් නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
ඉඩම්වල තොරතුරු. විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ දකුණු උඩුකහකෝරළේ පරමාඋල්ල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මුල් සිතියම 468.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1A | අරඹේදෙල්ගහමුලහේන | 1 1 24 |

මීට මායිම්—උතුරට මාබෝපිටිය යන ගමේ ගම්ඉමද, ආණ්ඩුව විසින් විකුණපු ගල්ගොඩහේනද (326,448 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු දෙල්ගහමුලවත්තද, (326,432 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුණපු තලගොල්ලවත්තද, (326,434 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු දළුක්ගහමූකලානද; බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු දළුක්ගහමූකලානද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1056—1057වෙනි පිටුවල ප්ලෑන් බලනු.

II.—මුල් සිතියම 468.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 4 .. | තලගොල්ලහේන .. .. .. .. | 1 0 11 |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු දළුක්ගහමූකලානද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු තලගොල්ලවත්තද, (326,434 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) ජයමහහිටිහාමිලාගේ උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන බුත්වලගාවාවත්තද; දකුණට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු මහඇලද, (දියපාර); බස්නාහිරට උරුළේමුල්ල යන ගමේ ගම්මුමද.

III.—මුල් සිතියම 468.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 8 .. | කොසුලහලගොඩහේන .. .. .. .. | 2 1 0 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණපු දෙල්ගහමූලවත්තද. (326,432 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) ගල්පොත්තේපොල යන ගමේ ගම්මුමද; නැගෙණහිරට ගල්පොත්තේපොල යන ගමේ ගම්මුමද; දකුණට පුංචිඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන කොසුලවත්තද, හිටිහාමිලාගේ උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන පරමාල්ලේ පන්සලද, බස්නාහිරට හිටිහාමිලාගේ උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන පරමාලල්ල පන්සලද, කිරිබන්ඩා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කොසුලවත්තද, සුබසින්මුදියන්සේලාගේ කිරිබන්ඩා පොලිස් මුලාදෑනියා සහ තවත් අය විසින් අයිතිකම්කියන ඉහල කොසුලකුඹුරද, සුබසින්මුදියන්සේලාගේ කිරිබන්ඩා පොලිස්මුලාදෑනියා සහ තවත් අය විසින් අයිතිකම්කියන පරනවත්තද.

IV.—මුල් සිතියම 468.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 22c .. | ගොරකගහමූලහේන .. .. .. .. | 0 1 31 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගොරකගහමූලවත්තද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු ගොරකගහමූලවත්ත, (315,365 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගොරකගහමූලහේන; දකුණට ආණ්ඩුව විසින් විකුණපු කන්දේහේනද, (316,310 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණපු තන්තේවත්තලන්ද සහ කොලොන්ගහමූලහේනද, (321,754 පිඹුරුකඩදාසියේ පේන ඉඩම.)

V.—මුල් සිතියම 468.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 33 .. | යහලදෙනිය නොහොත් මුරුතගහලන්ද .. .. .. | 0 3 9 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන යහලදෙනියවත්තද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු යහලදෙනිය මුරුතගහමුල්ලහේනද, (326,454 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුණපු යහලදෙනිය මුරුතගහමුල්ලහේනද, (326,454 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), ආණ්ඩුව විසින් විකුණපු ලියගුවහේනද, (316,307 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණපු ලියගුවහේනද, (316,307 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), ආණ්ඩුව විසින් විකුණපු කොලොන්ගහමූලහේනද නොහොත් බුත්වලේහේන, (321,755 පිඹුරුකඩදාසියේ පේන ඉඩම.)

[කුරුණෑගල වි. ම. 60—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 6,904.]

මේ 1918ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897, 1899, 1900යේ සහ 1903න් ආඥපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණබව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ දකුණු උඩුකහකෝරලේ ගල්දෙනිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 492 මුල් සිතියමෙ 11න් පෙනෙන අක්කර 1කුත් රූඩ් 2කුත් පර්චස් 26ක් බිම්තරම ඇති සාමාන්‍යවසයෙන් පුරනහේන කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිමකට්ටියට මායිම්:—උතුරට කුඩාඔයෙන් කොටසක්ද, 95,188 පිඹුරුකඩදාසියේ පේන ඉඩම; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු පුරනපිල්ලෑවද, (321,870 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) අමරසින්ආච්චිල්ලාගේ කිරිමැණිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන පුරනකුඹුරද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු ඔබඩපොලයාහේනද, (328,289 පිඹුරුකඩදාසියේ පේන ඉඩම); බස්නාහිරට කුඩාඔයෙන් කොටසක්ද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1058වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 61—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 6,905.]

මේ 1918ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897, 1899, 1900 සහ 1903යේ ආඥපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇවියතිලිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ දකුණු උඩුකහකෝරලේ තල්වත්ත යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටිය, එනම්:—

I.—මුල් සිතියම 487.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 2A .. | හකුරුගේහේන .. .. .. .. | 1 1 2 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණපු මොරමන්ඩියේමූකලානද (323,109 පිඹුරුකඩදාසියේ පේන ඉඩම,; නැගෙනහිරට ආණ්ඩුව විසින් විකුණපු මොරමන්ඩියහේනද (323,109 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), රජසන්තක ගල්කොටුවහේනද; දකුණට සහ බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන මොරගහමඩවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1058—1059වෙනි පිටුවල ප්ලෑන් බලනු.

II.—මූල් සිතියම 487.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 30 | කොහුකුඹුරේපිල්ලෑව | 1 0 4 |

මීට මායිම්—උතුරට රජපක්‍ෂමුදියන්සේලාගේ ජුවානිස්අප්පු විසින් අයිතිකම්කියන කොහුකුඹුරේවත්තද; ආණ්ඩුව විසින් විකුනාපු කටුකුඹුරහේන (325,926 පිඹුරුකබඩසියේ පේන ඉඩම); නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුනාපු කටුකුඹුරහේනද (325,926 පිඹුරුකබඩසියේ පේන ඉඩම); ආණ්ඩුව විසින් විකුනාපු පන්සලවත්තද (323,177 පිඹුරුකබඩසියේ පේන ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුනාපු පන්සලවත්තද (323,177 පිඹුරුකබඩසියේ පේන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු උරකටමුල්ලේහේනවත්තද (323,126 පිඹුරුකබඩසියේ පේන ඉඩම), රජසන්තක කොහුකුඹුරේපිල්ලෑවද; බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ඇලද.

[කුරුනෑගල වි. ම. 62—1918.]

---

[කුරුනෑගල දැන්වීම නො. 6,906.]

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900, සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඈන්. ඒ. හැම්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඈන්. ඒ. හැම්ටන්,  
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ දකුණු උඩුකහකෝරලේ කැප්පිටිවලාන යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි එනම්:—

I.—මූල් සිතියම 450.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 25 | කොස්ගහමූලහේන | 1 0 10 |

මීට මායිම්—උතුරට ගිරිඋල්ලේ සිට අලව්වට යන පාරද; රජසන්තක කොස්ගහමූලවත්තද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු කහටගහමූලවත්තද, (320,046 පිඹුරුකබඩසියේ පේන ඉඩම); දකුණට (ප්‍රවෙනි) දෙල්ගහමූලවත්තද, (ප්‍රවෙනි) හින්දේහේනවත්ත නොහොත් බඩල්වතුයායද; බස්නාහිරට (ප්‍රවෙනි) හින්දේහේනවත්ත නොහොත් බඩල්වතුයායද; ආණ්ඩුව විසින් විකුනාපු බුළුගහමූලහේනද (323,061 පිඹුරුකබඩසියේ පේන ඉඩම) මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන බුළුගහමූලහේනද (පාරට ඉතුරුකරතිබෙන බිම්කට්ටිය).

II.—මූල් සිතියම 450.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 38 | බෝගහකුඹුරපිල්ලෑව | 0 2 5 |

මීට මායිම්—උතුරට නැබඩවතුර යන ගමේ ගම්ඉමද; නැගෙණහිරට මුඩුබිම්සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන පරනඇලද (දියපාර); දකුණට සහ බස්නාහිරට ප්‍රවෙනිදෙමැද්දේකුඹුරුයායද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1059වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 63—1918.]

---

[කුරුනෑගල දැන්වීම, නො. 6,907.]

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඈන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ඈන්. ඒ. හැම්ප්ටන්,  
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

